2028 SAP Preliminary Examination

Online විභාග අපේක්ෂකයන් සඳහා පොදු උපදෙස් මාලාව

විභාග කාලසටහන

	Econ	BS
Online	ඔක්තෝම්බර් 31 සෙනසුරාදා ප.ව. 1 : 30 - ප.ව. 3 : 30	ඔක්තෝම්බර් 31 සෙනසුරාදා ප.ව. 4 : 00 - ප.ව. 6 : 00

- විෂයන් දෙකට ම පෙනී සිටීම සඳහා වෙන වෙන ම විභාග අයදුම්පත් ලබා ගත යුතු ය.
- Online විභාගයට පෙනී සිටින සිසු සිසුවියන් හට **ඔක්තෝම්බර් 17 සිට ඔක්තෝම්බර් 31 වන දින** ලබා දෙන වෙබ් Link එකට ප්‍රවේශ වීමෙන් විභාග ප්‍රවේශ පත්‍ර ලබාගත හැකි අතර එම ප්‍රවේශ පත්‍ර ලබාගත් පසු ඔබගේ ජංගම දුරකථනයට කෙටි පණිවිඩයක් මගින් විභාග අංකය ලැබෙනු ඇත. විෂයන් දෙක සඳහා ම උත්තර පත්‍රවල එම විභාග අංකය සටහන් කළ යුතු ය. ඊට අමතරව ඔබගේ නම, සක්යා හැඳුනුම්පත් අංකය පැහැදිලිව සටහන් කරන්න.
- Online විභාගයට පෙනී සිටින සිසු සිසුවියන් සිය පිළිතුරු පත්‍ර නොවැම්බර් 08 දිනට පෙර **සක්යා පර්යේෂණ හා ඇගයීම් සේවය, නො. 8, පීටර්ස් පෙදෙස, කොහුවල, නුගේගොඩ** යන ලිපිනයට ලියාපදිංචි තැපෑල මගින් හෝ සක්යා ඕනෑම ශාඛාවකට (නුගේගොඩ, ගම්පහ, කිරිබත්ගොඩ, පානදුර) පැමිණ හෝ බාර දිය යුතුය. එදිනට පසු ලැබෙන පිළිතුරු පත්‍රවල ඇගයීමක් සිදු නොවේ.
- ඔබ විසින් ලියාපදිංචි තැපෑල මගින් එවනු ලබන උත්තර පත්‍ර ඇතුළත් ලිපි කවරයෙහි ඉහළ වම් කෙළවරේ 'SAP 2028' යන්න සඳහන් කරන්න.
- Online විභාගයට පෙනී සිටින සිසු සිසුවියන්ගේ ප්‍රශ්න පත්‍ර ඇගයීම් සිදු කරන අතර, මධ්‍යස්ථාන වෙත පැමිණ විභාගය සඳහා පෙනී සිටින සිසු සිසුවියන්ගේ පමණක් කුසලතා ඇගයීම් මත ත්‍යාග පිරිනැමීමක් සිදු කෙරේ.
- ඔබගේ විභාග අංකය ඉදිරිපත් කිරීමෙන් ඇගයීම් කළ උත්තර පත්‍ර සක්යා-නුගේගොඩ ප්‍රධාන ශාඛාවෙන් ලබාගත හැකි ය. නැතහොත් ඇගයූ පිළිතුරු පත්‍ර නැවත ඔබ වෙත එවීම සඳහා **ඔබගේ ලිපිනය ලියූ දිග ලියුම් කවරයක් හා නියමිත ගාස්තුවට සරිලන** මුද්දර ද ඔබ ප්‍රශ්නපත්‍ර එවන ලියුම් කවරයේ ම ඇතුළත් කර අප වෙත එවන්න.

ආර්ථික විද්‍යාව ප්‍රශ්න පත්‍ර ව්‍යුහය

➔ ප්‍රශ්න පත්‍රය I හා II යනුවෙන් කොටස් දෙකකි. **මුළු ප්‍රශ්න පත්‍රය සඳහා කාලය පැය 02 යි.**

➔ I ප්‍රශ්න පත්‍රය **බහුවරණ ප්‍රශ්න 25** කින් සමන්විත වේ. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය. කාලය පැය එකයි.

➔ II ප්‍රශ්න පත්‍රය **ව්‍යුහගත රචනා ප්‍රශ්න 03 කින් සමන්විත වේ. ප්‍රශ්න** දෙකකට පිළිතුරු සැපයිය යුතුය. **කාලය පැය 01 යි.**

➔ පහත සඳහන් ඒකකයන්ට අදාළ විෂය දැනුම ප්‍රශ්න පත්‍රය මගින් පරීක්ෂා කෙරේ.

නිපුණතාව 1 - ආර්ථික විද්‍යාව හැඳින්වීම, නිෂ්පාදන සම්පත්, මූලික ආර්ථික ප්‍රශ්න හා ආර්ථික පද්ධති, නිෂ්පාදන හැකියා මායිම් ආදර්ශ

නිපුණතාව 2 - වෙළෙඳ පොළ ආර්ථිකයේ ඉල්ලුම අවසන් වන තෙක් (වෙළඳපොළ ආර්ථිකය නිබන්ධනයේ පිටු අංක 29 දක්වා)

<u>ව්‍යාපාර අධ්‍යයනය ප්‍රශ්න පත්‍ර ව්‍යුහය</u>

➔ ප්‍රශ්න පත්‍රය I හා II යනුවෙන් කොටස් දෙකකි. **මුළු ප්‍රශ්න පත්‍රය සඳහා කාලය පැය දෙකයි.**

➔ I ප්‍රශ්න පත්‍රය **බහුවරණ, හිස්තැන් පිරවීමේ හා කෙටි නිශ්චිත පිළිතුරු සහිත ප්‍රශ්න 25** කින් සමන්විත වන අතර සියලු ම ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයිය යුතු ය. කාලය පැය එකයි.

➔ II ප්‍රශ්න පත්‍රය **ව්‍යුහගත රචනා ප්‍රශ්න 03 කින් සමන්විත වේ. ප්‍රශ්න දෙකකට පිළිතුරු සැපයිය යුතුය. කාලය පැය 01 යි.**

➔ පහත සඳහන් ඒකකයන්ට අදාළ විෂය දැනුම ප්‍රශ්න පත්‍රය මගින් පරීක්ෂා කෙරේ.

නිපුණතාව 1 - ව්‍යාපාර පදනම හා පරිසරය

නිපුණතාව 2 - ව්‍යාපාර සමාජ වගකීම් හා ආචාරධර්ම

නිපුණතාව 3 - රජය හා ව්‍යාපාර

නිපුණතාව 4 - ව්‍යාපාර සංවිධාන, බද්ධ ව්‍යාපාර කොටස අවසන් වනතුරු (ව්‍යාපාර සංවිධාන නිබන්ධනයේ පිටු අංක 22 දක්වා)